# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 65 — 1973 ජුනි 22 වැනි සිකුරාදා — 1973.06.22

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු — ඇබෑර්තු ... ... | 743 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 755 |



සැළකිය යුතුයි.—(i) ශ්‍රී ලංකා පදනම් පනත් කෙටුම්පත අතිරේකයක් වශයෙන් පළකරන ලදි. (ii) මෙවර ප්‍රසිද්ධ කරනු උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් ද පළවේ. 1973 ජුනි 08 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ හා

## තනතුරු — ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිසන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත්කිරීම් වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා සේවයෙහි නියුක්ත වී සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට භාජන වීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට ඇතුළත් වන ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවල මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) **වැනි ඡේදයෙහි පලවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට** පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

---

6. ඉල්ලූ විටෙක පහත සඳහන් ලියකියවිලි සෑම අයදුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බව්තීස්ම සහතිකය හෝ අධ්‍යාපන රෙගුලාසි අනුව උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද ලුහුඬු සහතිකය හෝ භාරගනු නො ලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපන සහතික පත්‍රය.

(ඇ) චරිත සහතික දෙකක්. ඉන් එකක් අධ්‍යාපනය ලැබූ විද්‍යාල ප්‍රධානාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඈ) සිංහල සම්බන්ධයෙන් සාමාර්ථය ලබා ඇති උසස්ම විභාගයේ සහතිකය.

සටහන.—(i) අයදුම් පතට ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ අමුණා නොඑවිය යුතුය.

(ii) ඉල්ලූ විටෙක ලියකියවිලි ඉදිරිපත් නොකර අයදුම්කරුවන් ගේ ඉල්ලුම් පත් සලකා බලනු නොලැබේ.

7. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් ගේ අයදුම පත්‍ තමන් ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය.

8. ඉල්ලුම් පත්‍ර සහ ඒ සම්බන්ධයෙන් කවර දැනුම්දීමක් හෝ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් නැනට මිස මේ අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

වී. වී. ජයසිංහ,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය.

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය,
තැ. පෙ. 572, ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ,
1973 ජූනි මස 8 දින.

### ආදර්ශ අයදුම් පත්‍රය

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සංඛ්‍යාන සහකාර තනතුර

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. පෞද්ගලික ලිපිනය :————.

3. කාර්යාලයීය ලිපිනය :————.

4. (i) උපන් දිනය :————.

(ii) ඉල්ලුම් පත් බාරගන්නා අවසාන දිනට වයස :————, අවු :——, මාස :——.

5. (i) ලංකාවේ පුරවැසියකු වන්නේ පරම්පරාවෙන් ද, නැතහොත් ලියාපදිංචි වීමෙන් ද යන වග :————.

(ii) පරම්පරාවෙන් නම් පහත සඳහන් අයගේ උපන් ස්ථාන සඳහන් කරන්න.

(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

6. (i) විවාහක අවිවාහක බව :————.

(ii) විවාහක නම් දරුවන් ගණන :————.

7. ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් (සාමාර්ථය ලැබූ විෂයයන් ද සමග) :————.

8. සාමාර්ථය ලබා ඇති ඉහලම විභාගය :—

1. සිංහල :————.
2. දෙමළ :————.
3. ඉංග්‍රීසි :————.
4. අනෙකුත් භාෂා :————.

9. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේ ද? : ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණකටද? :————.

10. ඔබ සපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබුවෙක් ද? එසේ නම් දිනය සහ නඩු අංකය සම්පූර්ණ විස්තර ද සඳහන් කරන්න :————.

11. දැනට නියුක්ත රැකියාව හා ඊට පෙර කරන ලද රක්ෂාවන් (රක්ෂාවට බැඳුණු දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න)—

| පදවිය | ආයතනය | සිට | දක්වා | වාර්ෂික වැටුප් රු. |
|---|---|---|---|---|
| | | | | |

සැලකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුන් මෙහි 12 වන ඡේදයේ දැක්විය යුතුයි.

12. තවත් තොරතුරු කිසිවක් ඇත්නම් සඳහන් කරන්න :——.

13. චරිත සහතික ඉදිරිපත් කරනු ලබන දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් :————.

1. ————.
2. ————.

14. වෙනත් කරුණු :————.

මෙම අයදුම් පතෙහි මා විසින් කරණ ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන,

දිනය :————.

0-693—1973.06.22 දින අංක 65 දරන ගැසට් පත්‍රය

---

අංකය : ජී.වී./1/1.

### රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය
### සහකාර නීති උපදේශක තනතුර

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර නීති උපදේශක තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන අයදුම් පත්‍ර පුරවා 1973 ජූලි මස 13 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් හෝ මා වෙත ලැබෙන සේ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සටහන.—ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ පිළිබඳ ලිපියක් හෝ තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිදු පැමිණිල්ලක් ගැන සලකා බලනු නොලැබේ. අන්තිම දින තෙක් ඉල්ලුම් පත් ප්‍රමාද කරන අයදුම්කරුවන් එසේ ප්‍රමාද කළ යුත්තේ තමාගේ වගකීම පිටය.

2. **සේවයට බඳවා ගැනීම සහ සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායකයකු විය යුතුය.

3. **වැටුප් සහ දීමනා.**—තනතුරට අයත්වන්නේ වර්ෂයකට රු. 11,520 කින් ආරම්භ වී රු. 480 වාර්ෂික වැටුප් වැඩිවීම් 9 කින් හා රු. 600 වාර්ෂික වැටුප් වැඩිවීම් 3 කින් රු. 17,640 දක්වා වැඩි වන ඒකාබද්ධ වැටුප් ක්‍රමයකි. තෝරා ගන්නා අයගේ සුදුසුකම් අනුව ආයතන අධ්‍යක්ෂ විමසා සුදුසු වැටුප් තලයක තැබිය හැකිය.

(1969.10.01 දිනට පෙර පැවති අනුරූප මූලික වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 8,880—480×9—600×2—14,400 කි. රු. 11,280 දී අවුරුදු 2 ක නැවතීමක් සහිතව.)

සටහන.—තෝරාගනු ලබන අයදුම්කරු, තනතුරෙහි, ස්ථිර කරනු ලැබූ දින සිට දෙවර්ෂයක් ඇතුලතදී සිංහල භාෂා විෂයයෙන්, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සාමාර්ථය ලැබිය යුතුය. මේ පරීක්ෂණයෙන් සමත් වීමට නොහැකිවීම වැටුප් වැඩිවීම් විලම්බනය කරනු ලැබීමට හේතු වනු ඇත.

4. **වයස් සීමාව.**—සෑම අයදුම්කරුවෙක්ම 1973.02.24 දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (රජයේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන් කෙරෙහි ඉහළ වයස් සීමාව අදාල නොවේ).

5. **අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම්**—සෑම අයදුම්කරුවෙකුම—

(1) පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධිධාරියෙක් සහ අවුරුදු (2) දෙකකට නොඅඩු කාලයක් තුළ නීති වෘත්තියෙහි යෙදුනු ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිනීතිඥයෙකු හෝ බැරිස්ටර් උපාධිධාරියෙකු විය යුතුය.

(2) උපාධිය සඳහා හෝ අධි නීතිඥ විභාගය සඳහා හෝ බැරිස්ටර් විභාගය සඳහා හෝ පොදු ජාත්‍යන්තර නීතිය විෂයයක් වශයෙන් ගෙන සමත්ව තිබිය යුතුය.

(3) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

**සටහන.**—පොදු ජාත්‍යන්තර නීතිය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් ඇත්තාවූත්, ජාත්‍යන්තර සංවිධානවල සේවය කර ඇත්තාවූත්, ජාත්‍යන්තර නීති භාවිතා කිරීම් සම්බන්ධයෙන් ප්‍රයෝගික පළපුරුද් දක් ඇත්තාවූත් අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

6. ඉල්ලූ විටෙක පහත සඳහන් ලියකියවිලි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (**සැ. යු.** බව්තීස්ම සහතිකයවත අධ්‍යාපන රෙගුලාසි අනුව උපකෘත පාඨශාලාවල ප්‍රයෝජන සඳහා නිකුත් කරන ලද ලුහුඬු සහතිකවත් භාරගනු නොලැබේ).

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපන සහතික පත්‍රය.

(ඇ) චරිතය පිළිබඳ සහතික දෙකක්, ඉන් එකක් අධ්‍යාපනය ලැබූ ස්ථානයේ අධ්‍යක්ෂගෙන්, විද්‍යාල ගුරුවරයාගෙන් හෝ මහාචාර්‍ය්‍ය වරයාගෙන් විය යුතුය.

(ඈ) ලබා ඇති වෘත්තිය සහ/නොහොත් ප්‍රායෝගික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල සම්බන්ධයෙන් සාමාර්ථය ලබා ඇති උසස්ම විභාගයේ සහතිකය.

**සටහන.**—(i) ඉල්ලුම් පත්‍රයට ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ කිසිවක් අමුණා නොඑවිය යුතුය.

(ii) ඉල්ලූ විටෙක ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් සළකා බලනු නොලැබේ.

7. රජයේ සේවයේ නියුක්ත නිළධාරීන්ගේ අයදුම් පත් තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය.

8. ඉල්ලුම් පත්‍ර සහ ඒ සම්බන්ධයෙන් කවර දැනුම්දීමක් හෝ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම් තැනට මිස මේ අමාත්‍යංශයේ කිසියම් නිළධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

වී. ටී. ජයසිංහ,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යංශය.

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යංශය,
තැ. පෙ. 572, ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973 ජූලි 8 දින දී ය.

6–692—73.06.22 දින අංක 65 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව
### පිරිමි හෙදවර තනතුරු

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පිරිමි හෙදවර තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරගත් ඉල්ලුම් පත්‍ර 1973 ජූලි මස 06 වැදි දිනට හෝ ඊට පෙර, වැඩ බලන බන්ධනාගාර කොමසාරිස් තැන වෙත ලැබෙන ලෙස ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

ස්ථිර තනතුරු—9යි. තාවකාලික තනතුරු—9යි.

**සැ. යු.**—ඉල්ලුම් පත බහා එවන කවරයේ වම් කෙළවරේ උඩින්ම "පිරිමි හෙදවර තනතුරු සඳහා" යන්න සඳහන් කළ යුතුය.

2. **වැටුප් හා දීමනා.**—ස්ථිර තනතුරු සඳහා රු. 3,864—18 × 144—රු. 6,456. තාවකාලික තනතුරු සඳහා : මුල් හය මාසය තුළ දිනකට රු. 12 බැගින් ද, ඉන්පසු රු. 3,864—18 × 144—රු. 6,456 ක් වේ.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි.**—තනතුරු නවයක් (9) ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුයි. තෝරා ගනු ලබන අපේක්ෂකයා පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරයි නම් ඔහු තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත.

4. තෝරා ගනු ලබන අපේක්ෂකයා දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්තව නොමැති නම් තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කරනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයා දැනට රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක් දරයි නම් ඔහුගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක් සඳහා වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

5. (අ) තෝරා ගනු ලබන අපේක්ෂකයා දිවයිනේ ඕනෑම පළාතක සේවය කළ යුතුයි.

(ආ) මුල් වරට රාජ්‍ය සේවයට බැඳෙන අපේක්ෂකයා දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු බවට වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

6. **සුදුසුකම් :**

(අ) අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුයි.

(ආ) 1973.07.06 දිනට වයස අවුරුදු 19 ට නො අඩු සහ අවුරුදු 30ට නො වැඩි විය යුතුයි. (දැනට රජයේ හෝ හමුදා සේවයේ සිටින අයදුම් කරුවන් සඳහා වයස් සීමාව අදාල නොවේ.)

(ඇ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන විභාගයක් හෝ ඊට උසස් විභාගයකින් සමත් විය යුතුයි.

(ඈ) සුදුසුකම් ලත් පිරිමි හෙදවරුන් ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලය විසින් ලියා පදිංචි කර සිටිය යුතුයි.

7. අපේක්ෂකයින් තම ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතික පත්‍රයන්හි පිටපත් ඇමිණිය යුතුය :

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) වෛද්‍ය මණ්ඩලයේ පිරිමි හෙදවරයෙකු වශයෙන් ලියා පදිංචි වූ අංකය සහ වර්ෂය, සහතික පිටපත,

(ඈ) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක්.

8. ශ්‍රී ලංකා රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදය ආරම්භයේ එන රාජ්‍ය සේවාවේ තනතුරු සඳහා අදාල වන පොදු කොන්දේසි බලනු මැනවි. සියළු අයුරින් මෙම නිවේදනයේ ප්‍රකාර නො එවන ඉල්ලුම් පත්‍ර ප්‍රමාද වී එවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**දැනට රජයේ සේවයේ නියුක්ත අපේක්ෂකයින් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතුයි.**

ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

ඒ. ඒ. ද සිල්වා,
වැඩ බලන බන්ධනාගාර කොමසාරිස්.

1973 ජූනි මස 07 වැනි දින,
කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ දීය.

### බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පිරිමි හෙදවර තනතුර සඳහා ඉල්ලුම් කිරීම

ස. ල. (සහතික වල පිටපත් පමණක් ඇමිණිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.
   (අ) නම :————.
   (ආ) වාසගම :————.
2. ස්ථිර ලිපිනය :————.
3. ජාතිය :————.
4. 1973 ජූලි මස 06 දිනට වයස :————.
5. විවාහක ද/අවිවාහක ද යන වග :————.
6. දැනට සේවයේ යෙදී සිටින්නේ නම්,
   (අ) ස්වාමියා :————.
   (ආ) ස්ථානය :————.
   (ඇ) සේවා කාලය :————.
7. සාත්තු සේවය පිළිබඳ අභ්‍යාස ලද්දේ කොහිදී ද ? :————.
8.

| | කියවීම | ලිවීම | කථාකිරීම |
|---|---|---|---|
| සිංහල පිළිබඳ දැනුම | ...... | ...... | ...... |
| දෙමළ | ...... | ...... | ...... |
| ඉංග්‍රීසි | ...... | ...... | ...... |

9. හෙදවරයෙකු ලෙස ලියා පදිංචි අංකය හා වර්ෂය :————.
10. වෙනත් සුදුසුකම්/පළපුරුද්ද :————.
11. ළඟදී ලබාගත් චරිත සහතික :————.

මෙම අයදුම් පතෙහි ම විසින් සපයා ඇති විස්තර සත්‍ය සහ නිවැරදි ඒවා බැව් මෙයින් සහතික කරමි. මෙහි වූ යම් යම් විස්තර අසත්‍ය හෝ වැරදි හෝ ඒවා වුවහොත් හා එවැනි වැරදි, අපේක්ෂකයින් තෝරීමට පෙර සොයා ගනු ලැබුවහොත් තනතුර සඳහා මා නුසුදුස්සකු වීමට ඉඩ ඇති බැව් හා පත්වීම ලැබීමෙන් පසු එවැනි වැරදි සොයා ගනු ලැබුවහොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව ක්ෂණිකව රක්ෂාවෙන් අස්කළ හැකි බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–699—73.06.22 දින අංක 65 දරන ගැසට් පත්‍රය

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර වන සංරක්ෂක තනතුරු**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර වන සංරක්ෂක තනතුරු දෙකක් සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව සකස් කළ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 2, තැ. පෙ. 569, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර—1973 ජූලි 13 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර—1973 ජූලි 13 වැනිදා.

**සටහන්.—**

(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමාට ආසන්න හෝ රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ශ්‍රී ලංකාවේ නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිනිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

2. (i) **සේවය නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තෝරාගන්නා ලද අයදුම්කරු අවශ්‍යයයි නියමිත කරණ ලද පුහුණුව සඳහා පිටරට යැවීමට පිළිවන.

ඔහු පිටරට යවනු ලැබුවහොත්—

(අ) පිටරට යාමට පෙර දෙපාර්තමේන්තුවේ වැඩ පිළිබඳ අවබෝධයක් ඇතිකර ගැනීමට පහසුකම් සලසා දෙනු ලැබේ.

(ආ) රාජ්‍ය රෙගුලාසීන්ට අනුකූලව කොළඹ සිට යාමට සහ ආපසු පැමිණීමට අවශ්‍ය ඉඩකඩ නොමිලේ ලබාදෙනු ලැබේ. (පුහුණුවීම ඉල්ලුම්කරු නැවතී සිටින රටෙහි කෙරේ නම් යාමට ඉඩකඩ සලසනු නොලැබේ.)

(ඇ) එවැනි පුහුණුවීම් සම්බන්ධයෙන් දීමනා යනාදිය ගෙවනු ලබන්නේ එකල බලපාන රජයේ රෙගුලාසිවලට අනුවය.

(ii) **ගිවිසුම් හා ඇප.**—තෝරාගන්නා ලද අයදුම්කරු ශ්‍රී ලංකා ජනරජයත් සමග පහත සඳහන් ගිවිසුම්වලට ඇතුළත් විය යුතුය. එනම් :—

(අ) අනිකුත් කරුණු අතර, අවංක ලෙස හා උද්‍යොගිමත් ලෙස නියමිත පාඨමාලාව අධ්‍යයනය කොට, සතුටුදායක ලෙස නිමාවට පත්කොට, රජය විසින් ඉල්ලා සිටින්නේ නම්, රජය විසින් නියම කරනු ලබන කාලයක් ඇතුළත පුහුණු වෙන් පසු ශ්‍රී ලංකා ජනරජයට සේවය කරන බවට පොරොන්දුවීම.

(ආ) ගිවිසුම්වල කොන්දේසි හා රීති කඩ කළොත් අභ්‍යාස පාඨමාලාව සඳහා වූ මුළු වටිනාකම, ඒ කියනු-යේ, ශ්‍රී ලංකා ජනරජය විසින් දරණ ලද සියලුම වියදම් හා/හෝ මුළු අභ්‍යාසය සඳහා අන්‍යමාර්ගයකින් දරණ ලද වියදම් (එනම්; වේතනය, දීමනා, ගමන් ගාස්තු, ගාස්තු යනාදිය) සියලුම ශ්‍රී ලංකා ජනරජයට ගෙවන බවට පොරොන්දුවීම.

(iii) තනතුර ස්ථිරය. පත්වීම අර්ථසාධක අරමුදල් පදනම මත වෙයි. පත්කරනු ලැබූ දින සිට පෙරලා දිවයිනට පැමිණ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ භාරගෙන අවුරුදු 3ක් ගතවන තුරු ආධුනිකත්වය පිට තබනු ලැබේ. ශිෂ්‍යත්ව පිට සිටින කාලය තුළ හෝ ආධුනිකත්වය පිට සිටින කාලය තුළ හෝ ඔහුගේ සේවය අසතුටුදායක වේ නම්, එම කාලය තුළදී හෝ අවසානයේදී හෝ සේවයෙන් අස්කරනු ලැබේ. පත්වූ දින සිට සය (6) වසක් තුළ දී ඔහු ස්වභාෂා, නීතිය හා ගිණුම් පිළිබඳ විභාගයන්ගෙන් සමත්විය යුතුය.

3. **වැටුප් සහ දීමනා.**—මේ තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය රුපියල් 7,440 න් පටන්ගෙන රුපියල් 360 වාර්ෂික වැඩිවීම් 10 ක් හා රුපියල් 480 වැඩිවීම් 11 න් යුතුව, වර්ෂයකට රු. 12,000 ට සහ රුපියල් 14,880 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව රුපියල් 16,320 දක්වා නගී. තෝරා ගන්නා ලද ආධුනිකයා වන පාලන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් හෝ ලබා නොගතහොත් රුපියල් 11,520 වැටුප් පියවර පසුකිරීමට සුදුසු නොවන්නේ ය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1973 ජූලි 13 වැනි දිනට 30 වසකට වැඩි වයස් නොවන බව.

(ඇ) (i) උද්භිද විද්‍යාව විෂයයක් සහිතව හා සත්ව විද්‍යාව හා/හෝ රසායන විද්‍යාව අතිරේක විෂයයක් වශයෙන් ඇතිව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පළමුවන පන්තියේ හෝ දෙවන පන්තියේ හෝ විද්‍යා උපාධියක් හෝ ඊට සමාන සුදුසුකම් හෝ (විශේෂ උපාධියක් ඇති අය විශේෂයෙන් සලකා බලනු ලැබේ.), හෝ

(ii) කෘෂිකර්මය පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පළමුවැනි පන්තියේ හෝ දෙවැනි පන්තියේ හෝ ගෞරව උපාධියක් හෝ ඇති බව.

(පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ආයතනයකින් වන පාලන විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ ඩිප්ලෝමා සහතිකයක් හෝ ලබා ඇත්නම් එය අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ඇත.)

**සටහන.**—(i) දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයවළුන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

(ii) ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල අවසාන පරීක්ෂණවලට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයගෙන්ද අයදුම්පත් භාරගනු ලැබේ. එහෙත්, විශ්ව විද්‍යාලයෙන් ප්‍රතිඵල නිකුත් කළ වහා එම පරීක්ෂණයෙන් තමා සමත්වී තිබේද යන වග ඔවුන් විසින් මා වෙත දැනුම් දිය යුතුය. නොඑසේ නම්, ඔවුන්ගේ ඉල්ලුම් පත් සලකා බලනු නොලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (**සැ. යු.**—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ).

(බී) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ. යු.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර යෝ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

ඒ. ටී. එම්. සිල්වා,
කෘෂිකම් හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි 11 දින,
කොළඹ 2, වොක්ෂෝල් වීදියේ,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශ කාර්යාලයේදීය.
තැ. පෙ. 569.

ආදර්ශ අයදුම් පත්‍රය

**වන රක්ෂණ දෙපාර්තමේන්තුව**

සහකාර වන සංරක්ෂක තනතුර සඳහා අයදුම් පත්‍රය

**(අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය)**

1. **සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.**

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහා දැනුම් දිය යුතුය) :————.

3. (අ) උපන් දිනය :—

වර්ෂය :————, මාසය :————, දිනය :————.

(ආ) **ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :—**

**වර්ෂය :————, මාස :————, දින :————.**

4. ඔබ ලංකා රට වැසියෙක්ද? පාරම්පරික රටවැසියෙක්ද? එසේ නැතහොත් ලියාපදිංචි වූ රට වැසියෙක්ද යන බව **සඳහන් කරන්න :————.**

(ලියාපදිංචි වූ රට වැසියෙක් නම් සම්පූර්ණ විසාතර සඳහන් **කරන්න)**

5. **උපන් ස්ථානය :—**

(අ) **ඉල්ලුම්කරුගේ :————.**

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයෙ මී මුත්තාගේ :————.

6. ස්ත්‍රී පුරුෂ භාවය :————.

**(ඇ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවක්ද යන බව : ————.**

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—

**(1) සිංහල :————.**

**(2) දෙමළ :————.**

**(3) ඉංග්‍රීසි :————.**

8. වයස අවුරුදු 12 න් පසුව ඉගෙනිම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය. | | | වෘත්තීය අධ්‍යාපනය. | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය. | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| (1) ———— | | | (1) ———— | | |
| (2) ———— | | | (2) ———— | | |

9. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේද? ණයගැතිව සිටින්නේ නම් ඒ කොපමණද? :————.

10. ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා **ලැබුවෙක්ද? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ** විස්තර සඳහන් කරන්න :————.

11. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික **සුදුසුකම් (ලබාගන්නා ලද සියළුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය හා කාර්මික** සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් **ආයතනවල නම් සඳහන් කරන්න) :————.**

12. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථම කරන ලද රක්ෂාවන් (රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න) :————.

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| (2) ———— | | | |
| (1) ———— | | | |

සැලකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට **හේතුව මෙහි 13 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුයි.**

13. තවත් **තොරතුරු කිසිවක්** වේ නම් ඒවා :————.

14. ඔබ ගැන තොරතුරු **විමසිය යුතු ඔබ හොඳට දන්නා හඳුනන** පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඉදිරිපත් කරන්න :—

(1) ————.

(2) ————.

15. මෙම ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සපයන ලද **තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි** ඇතුලත් තොරතුරු වලින් **කිසිවක් අසත්‍ය හෝ** වැරදි බව මා නෝරා ගැනීමට පෙර දැන ගතහොත් මා නුසුදුස්සකු විමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැන ගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයේ පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

.....................................

**ඉල්ලුම්කරුගේ අත්සන.**

දිනය :————.

(අයදුම්කරු රාජ්‍ය **සේවයේ** නම් දෙපාර්තමේන්තු **ප්‍රධානියාගේ** වාර්තාව)

.....................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

6-783—73.06.22 දින අංක 65 දරන ගැසට් පත්‍රය

---

අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පැවැත්වෙන 1974 වර්ෂයේ එක් අවුරුදු අභ්‍යන්තර අධ්‍යාපන ඩිප්ලෝමා පශ්චාත් උපාධි පාඨමාලාව සහ දෑවුරුදු තැපල් මාර්ගික අධ්‍යාපන ඩිප්ලෝමා පශ්චාත් උපාධි පාඨමාලාව

අධ්‍යාපන විද්‍යා ඩිප්ලෝමාව සඳහා ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පවත්වනු ලබන ඉහත සඳහන් පාඨමාලාව සඳහා තෝරා ගැනීම පිණිස පහත සඳහන් ගුරුවර ගුරුවරියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ :—

(i) රජයේ විද්‍යාල්වල හා ගුරු විදුහල්වල සේවය කරන උපාධිධාරි ගුරුවර ගුරුවරියන් ;

(ii) රජයේ කාර්මික අධ්‍යාපන ආයතනවල සේවය කරන උපාධිධාරි ගුරුවර ගුරුවරියන් (මොවුන් බඳවා ගනු ලබන්නේ දෑවුරුදු තැපැල් මාර්ගික පාඨමාලාවටය).

(iii) ලංකා අධ්‍යාපන සේවයට අයත් උපාධිධාරි නිලධාරීන්.

**2.** අභ්‍යන්තර අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ කාලය එක් අවුරුද්දක් වන අතර තැපැල් මාර්ගික අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ කාලය අවුරුදු දෙකකි.

3. **ඉල්ලුම් කළ යුතු පිළිවෙල.—**

(අ) **මේ සමග ඇති ආකෘතිය අනුව පිළියෙල කරගත් ඉල්ලුම් පත්‍ර 1973 ජූලි මස 12 වැනි දිනට හෝ ඊට පෙර කොළඹ 2,** මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, ගුරු අධ්‍යාපන ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ආ) අයදුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය

(ඇ) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නො ලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත් එවීම ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව ඉල්ලුම්කරුවන් විසින් ම විඳ දරාගත යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවකුම—

(අ) ශ්‍රී ලංකා ජනරජයේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) අභ්‍යන්තර එක් අවුරුදු පාඨමාලාව හැදෑරීමට ඉල්ලුම් කරන්නේ නම් ඉල්ලුම්කරුගේ වයස 74. 01. 01 දිනට අවුරුදු 45 ට වැඩි නොවිය යුතු අතර තැපැල් මාර්ගික පාඨමාලාව හැදෑරීමට ඉල්ලුම්කරන්නේ නම් ඉල්ලුම්කරුගේ වයස 74. 01. 01 දිනට අවුරුදු 50 ට වැඩි නොවිය යුතුය.

(ඉ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියකු විය යුතුය.

(ඊ) (i) **උපාධිධාරී වැටුප් ක්‍රමය යටතේ උපාධිධාරි ගුරු පත්වීමක් ලැබ 1973 ජූලි 12 දිනට අවුරුදු 5 කට නොඅඩු කාලයක් රජයේ විදුහලක හෝ ගුරු විදුහලක හෝ රජයේ කාර්මික අධ්‍යාපන ආයතනයක හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් තිබිය යුතුය.**

නැතහොත්

(ii) 1973 ජූලි 12 දිනට අවුරුදු 10 කට වැඩි ගුරු සේවයක් ඇත්තාවූද, ඉන් අවුරුදු 3 කට නොඅඩු කාලයක් උපාධිධාරී වැටුප් ක්‍රමය යටතේ උපාධිධාරී ගුරුවරයෙකු වශයෙන් රජයේ විද්‍යාලක හෝ ගුරු විදුහලක හෝ රජයේ කාර්මික අධ්‍යාපන ආයතනයක හෝ ඉගැන්වීමේ පළපුරුද්ද ඇත්තාවූ ද විය යුතුය.

(iii) ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් හෝ ප්‍රධාන අධ්‍යාපන නිලධාරියා විසින් හෝ පත්වීම අනුමත කරනු ලැබ පිළිගත් පෞද්ගලික පාසලක යෝග්‍ය ගුරු මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් කර ඇති සේවයද, ඉගැන්වීමේ පළපුරුද්ද ගණන් ගැනීමේ දී පිළිගනු ලැබේ. මෙම කාර්ය සඳහා 1951 දී ගාස්තු අය කරන පාඨශාලා බවට පත් වූ උපකෘත පාඨශාලා සහ 1960.12.01 දින ගාස්තු අය නොකරන පෞද්ගලික පාසැල් බවට පත් වූ පාඨශාලාත් පිළිගත් පෞද්ගලික පාඨශාලා වශයෙන් සැලකේ.

(iv) ප්‍රාචීන පණ්ඩිත සහතිකය මත උපාධි වැටුපෙහි පිහිටුවනු ලැබූ, ප්‍රාචීන පණ්ඩිත සහතිකය ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරීන්ට මෙහි අවශ්‍යව ඇති ඉගැන්වීමේ පළපුරුද්ද සඳහා, ඔවුන් උපාධිධාරී වැටුප් ක්‍රමයෙහි පිහිටුවන ලද දිනයේ සිට සේවය ගණන් ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(උ) ඉංග්‍රිසි/සිංහල/දෙමළ පිළිබඳ මනා දැනුමක් ඇති අයෙක් බවට ද සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

(ඌ) මීට පෙර අධ්‍යයන නිවාඩු ලබා ගැනීම සඳහා බැඳුම්කර අත්සන් තබා ඇති ගුරුවරුන් අභ්‍යන්තර එක් අවුරුදු පාඨමාලාව සඳහා ඉල්ලුම් පත්‍ර එවීමට සුදුසු වනනේ ඔවුන් විසින් අත්සන් තබා ඇති බැඳුම්කර අනුව සේවය කිරීමට බැඳී ඇති කාල සීමාවෙන් අඩුම වශයෙන් අවුරුදු 5 ක කාලයක් 1973 ජූලි 12 වැනි දිනට සම්පූර්ණ කර තිබේ නම් පමණකි. එසේ සම්පූර්ණකර නොමැති අය විසින් එවනු ලබන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. මෙම ගැසට් නිවේදනයෙහි සඳහන් අවශ්‍ය සුදුසුකම් සපුරා නැති බව තෝරා ගැනීමේ පරීක්ෂණයට පෙර හෝ ඉන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔප්පු වුවහොත් එවැනි අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කර ඔවුන්ගේ විභාග අපේක්ෂකත්වය වහාම අවලංගු කරනු ලැබේ. එමෙන්ම මෙම පාඨමාලාව පවත්වනු ලබන කාල සීමාව තුළ කවර අවස්ථාවකදී හෝ තමාගේ වැඩ, හැසිරීම හා පැමිණීම අසතුටුදායක වන අය පාඨමාලාවෙන් නවත්වනු ඇත.

6. **තෝරා ගැනීම.**—ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි. ලිඛිත පරීක්ෂණය 1973.08.25 දින විභාග කොමසාරිස් විසින් පවත්වනු ලැබේ.

**විභාගයේ විෂයයන්.**—

(I) වත්මන් තතු පිළිබඳ සාමාන්‍ය තොරතුරු හා දැනුම, අධ්‍යාපන ප්‍රශ්න පිළිබඳ තොරතුරු හා දැනුම.

(II) සාමාන්‍ය බුද්ධිය.

7. පාඨමාලාව හැදෑරීමට තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම පවත්වනු ලබන අතර, තෝරා ගත් අය සඳහා මෙම පාඨමාලාව සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පමණක් පවත්වනු ලැබේ.

8. **ශිෂ්‍යත්ව.**—

පාඨමාලාව සාර්ථක ලෙස හදාරා නිමවීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 5 ක කාල පරිච්ඡේදයක් දෙපාර්තමේන්තුව යටතේ සේවය කිරීමට පොරොන්දු වෙමින් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරි සමඟ බැඳුම්කරයකට හා ශිෂ්‍යත්ව පත්‍රයකට අභ්‍යන්තර එක් අවුරුදු පාඨමාලාව සඳහා තෝරා ගත් ඉල්ලුම් කරුවන් ඇතුළත් විය යුත්තේය. එහෙත් පුහුණුවීමේ වියදම රු. 10,000 කට වැඩි කල්හි බැඳුම්කරය යටතේ සේවය කළ යුතු කාලපරිච්ඡේදය ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ දී ඇති උපදෙස් අනුව තීරණය කරනු ලැබේ.

9. නියමිත කාල සීමාව තුළදී ඩිප්ලෝමා උපාධිය ලබා ගැනීමට අසමත් වන අභ්‍යන්තර එක් අවුරුදු පාඨමාලාව හැදෑරූ ඕනෑම අපේක්ෂකයෙකු විසින් ඔහුට/ඇයට අධ්‍යයන නිවාඩු කාලයේ දී වැටුප් හා දීමනා වශයෙන් ගෙවන ලද සම්පූර්ණ මුදල ආපසු රජයට ගෙවිය යුතුය.

10. **අධ්‍යයන නිවාඩු.**—

අභ්‍යන්තර එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන ඉල්ලුම්කරුවන්ට සම්පූර්ණ කාල වැටුප් සහිත අධ්‍යයන නිවාඩු දෙනු ලැබේ. එවැනි ඉල්ලුම්කරුවන් විසින් අධ්‍යයන නිවාඩු සඳහා තමන් දැනට සේවය කරනු ලබන අධ්‍යාපන ප්‍රදේශයේ/දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කාර්යාලවලින් ලබා ගත හැකි ආකෘති මත එම කාර්යාල වෙත ඉල්ලුම් කළ යුතුයි. මෙම පාඨමාලාවට තෝරා ගනු ලබන ලංකා අධ්‍යාපන සේවයේ නිලධාරීන් විසින් ඔවුන්ගේ අධ්‍යයන නිවාඩු පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ, සාමාන්‍ය පරිපාලන ශාඛාවේ, ලංකා අධ්‍යාපන සේවා ඒකකය වෙත ඉල්ලුම් කළයුතු ය.

11. විභාගාපේක්ෂකයා රුපියල් විස්සක් වටිනා මුද්දර අලවා ඒ උඩ අත්සන සහ දිනය යොදා අවලංගු කළ යුතුය. මුද්දර එක පිට එක ඇලවිය යුතු නැත.

ප්‍රේමදාස උඩගම,
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 ජූනි මස 6 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
ගුරු විද්‍යාල ශාඛාවේ දීය.

**ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පැවැත්වෙන 1974 වර්ෂයේ එක් අවුරුදු අභ්‍යන්තර අධ්‍යාපන ඩිප්ලෝමා පශ්චාත් උපාධි පාඨමාලාව සහ දෑවුරුදු තැපැල් මාර්ගික අධ්‍යාපන ඩිප්ලෝමා පශ්චාත් උපාධි පාඨමාලාව**

ඇතුල්වීමේ ඉල්ලුම් පත්‍රය

1. (i) සම්පූර්ණ නම :————.
(මයා/මහත්මිය/මෙනෙවිය/පූජ්‍ය)
(ii) (මුලකුරු සහිතව) නම :————.

2. ජාතිය :————.

3. (i) උපන් දිනය :————.
(ii) 1974.01.01 වැනි දිනට වයස :— අවු. :————. මාස :————.
(iii) ගුරුවරයෙකු වශයෙන් ලියාපදිංචි අංකය :————.

4. ලිපිනය :—
(i) රාජකාරි :————.
(ii) පුද්ගලික :-————.

5. අධ්‍යාපනය ලැබූ විශ්ව විද්‍යාලය :————.
(අනු පිළිවෙලින්)

6. (i) සමත් වූ උපාධිය :————. විශ්ව විද්‍යාලය :————. වර්ෂය :————.
අංශය ඒ/බී සාමාන්‍ය/විශේෂ/සාමාර්ථ/ගෞරව පන්තිය/ කොටස ප්‍රථම/ද්විතීය/තෘතීය/සාමාර්ථය
(ii) උපාධිය සඳහා ගත් විෂයයන් :————.
(iii) විශ්ව විද්‍යාලයේ දී අධ්‍යාපනය ලැබූ මාධ්‍යය :————.

7. පාසලේ දී හෝ ඉන් පසුව ලබාගත් ශාස්ත්‍රීය හා වෙනත් විශිෂ්ඨතා :————.

8. දැනට උසුලන තනතුරු :—
තත්ත්වය :—(i) විද්‍යාලයාධිපති I ශ්‍රේණිය, II ශ්‍රේණිය, III ශ්‍රේණිය, උප විද්‍යාලයාධිපති විශේෂ තනතුරු I ශ්‍රේණිය, II ශ්‍රේණිය, III ශ්‍රේණිය/උප ගුරු ගෞරව උපාධිධාරි/උපාධිධාරි :————.
(ii) ලංකා අධ්‍යාපන සේවයට අයත් නම්, ලබා ඇති තනතුර හා එම තනතුරට පත්වූ දිනය : ————.

9. (i) ඉගැන්වීමේ පළපුරුද්ද :— අවු :———, මාස :———.
කාල පරිච්ඡේදය, පාසලේ නම, ඉගැන්වූ විෂයයන්, මාධ්‍ය, ඉගැන්වූ පන්ති.
(අ) ————.
(ආ) ————.
(ii) උපාධිය ලැබීමෙන් පසු 1973 ජූලි 12 දිනට රජයේ විදුහලක/ගුරු විදුහලක/කාර්මික විදුහලක ඉගැන්වීමේ පළපුරුද්ද : ————.

10. (i) ඉංග්‍රීසි භාෂාවෙන් ලබා ඇති සුදුසුකම් :————.
(ii) සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් ඉල්ලුම්කරුට ඉගැන්විය හැකි විෂයයන් හා පන්ති :————, විෂයය :————, උසස් ශ්‍රේණිය :————.

11. ඉල්ලුම්කරුගේ වාසියට හේතුවන කවර හෝ විශේෂ අධ්‍යයන හෝ ප්‍රකාශන :————.

12. ඉල්ලුම්කරුගේ පාසලට සහාය ලැබෙන විෂය මාලාවෙන් බාහිර ක්‍රියාකාරීත්වයන් :————.

13. ඉල්ලුම්කරු විසින් සහභාගි වූ පාසලෙන් බැහැර සාමාජික හා සුබසාධක ක්‍රියාකාරීත්වයන් :————.

14. ස්වකීය ඉල්ලුම් පත්‍රයට වාසිවන පරිදි ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කිරීමට කැමැති වෙනත් තොරතුරු :————.

15. මීට ප්‍රථම ලබා ඇති අධ්‍යයන නිවාඩු පිළිබඳ විස්තර හා බැඳුම්කරයේ කාල පරිච්ඡේදය :————.

16. ඉල්ලුම්කරුට විරුද්ධව විභාග කිරීමට නියමිත කිසියම් විනයානුකූල පරීක්ෂණයක් ඇත්තේ නම් එහි විස්තර :————.

17. ඉල්ලුම්කරු මෙම පරීක්ෂණයට පෙනී සිටීමට කැමති මාධ්‍යය සඳහන් කරන්න :————. 6

18. ඉල්ලුම්කරු හැදෑරීමට බලාපොරොත්තු වන්නේ එක් අවුරුදු අභ්‍යන්තර පාඨමාලාවද, නොඑසේ නම් දෑවුරුදු තැපැල් මාර්ගික පාඨමාලාවද යන වග සඳහන්කරන්න :————.

මුද්දර අලවා අවලංගු කරන්න.

ඉහත සඳහන් කළ තොරතුරු නිරවද්‍ය බවට සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

(ඉල්ලුම්කරු සේවයෙහි නියුක්ත විදුහලේ ප්‍රධානියා මගින් මෙම ඉල්ලුම් ඉදිරිපත් කළ යුතුයි.)

–849—73.06.22 දින අංක 65 දරන ගැසට් පත්‍රය

---

## වවුනියා දිස්ත්‍රික්කයේ මුල්ලියාවලෙයි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

වවුනියා දිස්ත්‍රික්කයේ මුල්ලියාවලෙයි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරණ ලෙස මෙයින් ආරාධනා කරමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1973 ජූලි මස 07 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රුපියල් 10 බැගින් ගෙවනු ලැබේ.

3. අයදුම්කරුට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළයුතුයි :—

(අ) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) අයදුම්කරු ඉහත කී මුල්ලියාවලෙයි ප්‍රදේශයේ ස්ථිර පදිංචි කරුවෙකු වීම.

(ඈ) (i) 1925 සිට 1944 දක්වා වූ කාලයෙහි දෙමළ පාඨශාලා හැර යාමේ සහතික පත්‍ර විභාගය හෝ, දෙමළ භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ විභාගය හෝ දෙමළ භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම.

(ii) දෙමළ භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම හෝ ඒ හා සමාන හෝ එයට උසස් විභාගයකින් සමත් වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද, අයදුම්පත් භාර ගනු නොලැබේ.

6. අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම්පත් ලේඛණගත තැපෑලෙන් එවිය යුතුය.

එල්. පී. වික්‍රමාරච්චි,
වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ජූනි මස 04 වැනි දින,
වවුනියා දිසාපති කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම් පත්‍රය

### වවුනියා දිස්ත්‍රික්කයේ මුල්ලියාවලෙයි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නාමය පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම්පත් භාරගන්නා දිනට සම්පූර්ණ වයස :————.
(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේ ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපොළවල වටිනාකම සහ ප්‍රමාණයන්, පැ තර සහිත :————.

10. අයදුම්කරු ණය ගැතිව සිටී ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණය මගින් දඬුවම් ලබා තිබේ ද? :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–794—73.06.22 දින අංක 65 දරන ගැසට් පත්‍රය

---

## වවුනියා දිස්ත්‍රික්කයේ නෙඩුන්කේනි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

වවුනියා දිස්ත්‍රික්කයේ නෙඩුන්කේනි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරණ ලෙස මෙයින් ආරාධනා කරමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1973 ජූලි මස 07 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රුපියල් 10 බැගින් ගෙවනු ලැබේ.

3. අයදුම්කරුට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නො අඩු හා 60 කට නො වැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) අයදුම්කරු ඉහත කී නෙඩුන්කේනි ප්‍රදේශයේ ස්ථිර පදිංචි කරුවකු වීම.

(ඈ) (i) 1925 සිට 1944 දක්වා වූ කාලයෙහි දෙමළ පාඨශාලා හැර යාමේ සහතික පත්‍ර විභාගය හෝ, දෙමළ භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ විභාගය හෝ දෙමළ භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කනිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම.

(ii) දෙමළ භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම හෝ ඒ හා සමාන හෝ එයට උසස් විභාගයකින් සමත් වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද, අයදුම්පත් භාර ගනු නො ලැබේ.

6. අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නො ලැබේ. අයදුම් පත් ලේඛණගත තැපෑලෙන් එවිය යුතුය.

එල්. පී. වික්‍රමාරච්චි.
වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ජූනි මස 04 වැනි දින,
වවුනියා දිසාපති කාර්යාලයේ දීය.

ආදර්ශ අයදුම් පත්‍රය

**වවුනියා දිස්ත්‍රික්කයේ නෙඩුන්කේනි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නාමය පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————

4. (අ) අයදුම්පත් භාරගන්නා දිනට සම්පූර්ණ වයස .————.
(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපොලවල වටිනාකම සහ ප්‍රමාණයන්, විස්තර සහිත :————.

10. අයදුම්කරු ණය ගැතිව සිටී ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණය මගින් දඬුවම් ලබා තිබේ ද? :————

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6-795—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

**කන්කසන්තුරේ සුළු නගර සහා ප්‍රදේශයට හදිසි මරණ පරීක්ෂක වරුන් පත්කිරීම**

කන්කසන්තුරේ සුළුනගර සභා ප්‍රදේශයට හදිසි මරණ පරීක්ෂක තනතුරක් සඳහා හදිසි මරණ පරීක්ෂකවරයෙක් පත් කිරීම පිණිස එම ගම් සහා ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් ඉල්ලුම්පත් යාපනය දිසාපති විසින් භාරගනු ලැබේ.

2. රජයේ, සංස්ථා සහ පළාත් පාලන ආයතනවල සේවකයන් ගෙන් පළාත් පාලන ආයතනවල නියෝජිතයන්ගෙන් සහ 73.07.05 වැනි දිනට වයස අවුරුදු 30ට අඩු හෝ 60ට වැඩි අයගෙන් අයදුම් පත් භාරගනු නොලැබේ.

3. සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් විස්තර හා ලියකියවිලි සැපයිය යුතුව ඇත.

(1) සම්පූර්ණ නම සහ ලිපිනය :————.

(2) පදිංචි ස්ථානය :————.

(3) වයස සහ උපන් දිනය :————

(4) විවාහකද අවිවාහකද යන වග :————.

(5) අධ්‍යාපන සුදුසුකම් : ඉංග්‍රීසි :————, දෙමළ :————.

(6) දැනට දරන හෝ කලින් දැරූ තනතුර හෝ තනතුරු :————.

(7) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් :————.

එම්. ඊ. ඩබ්. අමරසේකර,
යාපනය දිසාපති.

1973 ජූනි මස 08 වැනි දින,
යාපනය දිසාපති කාර්යාලයේ දී ය.

6-802—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

**ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**

මෙම දෙපාර්තමේන්තුවේ ආධුනික සැලසුම්කරු තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කළයුතු එකී අයදුම් පත් 1973 ජූලි 03 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස කොළඹ 1, ගොඩනැගිලි දෙපාර්ත මේන්තුවේ ගොඩනැගිලි අධ්‍යක්ෂ, 'කල' ශාඛාව වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

2. වැටුප.—මෙම තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් ක්‍රමය නම් වර්ෂයකට රු. 3,000—90×3—3,270 කි.

**සැලකිය යුතුයි.**—5 (iii) (අ) සහ 5 (iii) (ආ) ඡේද යටතේ නියමිත සුදුසුකම් ලබා සිටින අපේක්ෂකයන්ට ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ පිළිවෙලින් රු. 3,090 සහ 3,180 යන ආරම්භක වාර්ෂික වැටුප් ලැබීමට සුදුසුකම් ලැබේ.

3. **වයස් සීමාව.**—1973 ජූලි මස 03 දිනට වයස අවුරුදු 18කට නො අඩු සහ 30 කට නොවැඩි විය යුතුයි.

4. **සේවයේ යෙදවීමේ නියමයන් :—**

(i) මෙම තනතුරු තාවකාලිකය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ලැබේ.

(ii) තම අධ්‍යයන කටයුතු උද්‍යෝගයෙන් හා අනලස්ව කරගෙන යන බවට සහ II පෙල සැලසුම්කරුවන් ලෙස සුදුසුකම් ලබා ගන්නා බවටත් එසේම පුහුණුව සම්පූර්ණ කළ පසු නියම කරනු ලැබුවහොත් II පෙල සැලසුම්කරුවකු වශයෙන් අවුරුදු 5 කට නො අඩු කාලයක් සඳහා මෙම දෙපාර්තමේන්තු වෙහි සේවය කරන බවටත් පොරොන්දු වෙමින්, මෙම දෙපාර්තමේන්තුව සමග ගිවිසුමකට බැඳෙන ලෙස පත් කරනු ලබන අයට නියම කරනු ඇත. මෙකී නියමයන් සහ කොන්දේසි හරියාකාර ලෙස ඉටු කිරීම සඳහා ඇපකරුවන් දෙදෙනකු සමග රු. 6,500ක බැඳුම්කරයකට ඇතුලත් වන ලෙස පුහුණුවන්නන්ට සහ මව්පියන්ට හෝ භාරකරුවන්ට නියම කරනු ඇත.

5. **අවශ්‍ය අධ්‍යාපන සහ අනෙක් සුදුසුකම් :—**

(i) විශිෂ්ඨ චරිතයකින් සහ මනා කායික ශක්තියකින් යුක්ත විය යුතුය.

(ii) (අ) ගණිතය සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාග යෙන් හෝ

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ සාමාර්ථය

සහිතව

(iii) (අ) ලංකා කාර්මික විද්‍යාලයේ සැලසුම්කරුවන්ගේ පූර්ණ කාලීන එක් අවුරුදු දිවා පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර සිටීම

හෝ

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් ගේ දෑවුරුදු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර සිටීම

**සැළකිය යුතුයි.**—සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහල අපේක්ෂකයෙකු වේ නම් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ ඊට සමාන විභාගයකදී සිංහල භාෂාවෙන් හෝ ඊට සමාන විෂයකින් සමත් වී සිටිය යුතුයි.

(1961 ජනවාරි 1 වැනිදාට පෙර දිනයක සිට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින සහ රාජ්‍ය සේවයේ අනෙක් තනතුරු සඳහා පත්වීම් අපේක්ෂා කරන නිලධාරීන්ට මේ අවශ්‍යතාවය අදාල නොවේ.)

6. **සේවා කොන්දේසි :—**

(i) ඉහත ඇති 5 (iii) (අ) ඡේදය අනුව සුදුසුකම් ලබා තෝරාගනු ලැබ සිටින අපේක්ෂකයන්ට මේ දෙපාර්තමේන්තුවෙහි දෑ අවුරුදු ප්‍රායෝගික පුහුණුවක් ලබා ගැනීමට නියම කරන අතර, 5 (iii) (ආ) ඡේදය අනුව සුදුසුකම් ලබා තෝරාගනු ලැබ සිටින, අපේක්ෂකයන්ට එක් අවුරුදු ප්‍රායෝගික පුහුණුවක් ලබා ගැනීමට නියම කෙරෙනු ඇත.

(ii) ප්‍රායෝගික පුහුණුව සාර්ථක ලෙස සම්පූර්ණ කළ පසු සහ දෙපාර්තමේන්තුවේ නියමිත විභාගය සමත් කළ පසු ශ්‍රේණිවල ඇබෑර්තු තිබුනොත්, ii පෙල සැලසුම්කරුවන් වශයෙන් පත්වීම් ලැබීමට මේ අපේක්ෂකයෝ සුදුස්සෝ වෙති.

(iii) කාර්යාලය තුළ සහ ඉන් පිටතද වැඩ කිරීමට, තෝරාගනු ලැබූ අපේක්ෂකයන්ට නියම කෙරෙනු ඇත.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග, මුදල් රෙගුලාසි. ආයතන සංග්‍රහයේ රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ රජය මගින් කලින් කල නිකුත් කරන වෙනත් නියෝග හෝ රෙගුලාසි වලට ඔවුන් යටත් විය යුතුයි.

(v) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාද, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනට සම්පාදනය කර ඇති හෝ මින් මතු සම්පාදනය කෙරෙන හෝ ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියා කරන ලෙස ඔවුන්ට නියම කරනු ඇත.

7. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ.) අයදුම් කරුවන් විසින් අමුනා එවිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාසැල් පිළිබඳව ඇති රෙගුලාසි සංග්‍රහයේ අරමුණු සඳහා නිකුත් කර ඇති සහතිකය හෝ භාරගනු නොලැබේ.)

(ආ) කාර්මික සුදුසුකම් සනාථ කරන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (IIඅ) වැනි ඡේදය ආරම්භයේ පළකර ඇති, රාජ්‍ය සේවා තනතුරු වලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලන්න.

ජේ. බී. වීරත්න,
ගොඩනැගිලි අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජූනි මස 11 දින,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, කොළඹ 1.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

**ආධුනික සැළසුම්කරු තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය**

1\. (i) නම (මුරකුරු සමග) :————.
(ii) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) ————.

2\. ලියුම් ලැබෙන පිළිවෙල :————.

3\. (i) උපන් දිනය හා ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
(ii) 1973 ජූලි 03 දිනට වයස :————.
අවුරුදු :————, මාස :————.

4\. (i) ජාතිය :————.
(ii) ලාංකිකවූයේ පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද?: ————.

5\. විවාහකද අවිවාහකද යන බව :————.

6\. අධ්‍යාපන සහ කාර්මික සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

7\. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8\. මීට කලින් ආණ්ඩුවේ යම් කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.

9\. කාර්මික පුහුණුවක් ඇතොත් විස්තර :————.

10\. චරිත සහතික දී ඇති පුද්ගලයන් ගේ නම් සහ පදවි නාම : ————.

මා විසින් ඉහත සපයා ඇති තොරතුරු සත්‍ය බව හා නිවැරදි බව සහතික කරමි. මෙහි අඩංගු කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරාගනු ලැබීමට පෙර සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සකු කරනු ලැබීමටත්, පත් කිරීමෙන් පසු එම ප්‍රමාද දෝෂය අසුවුවහොත්, වන්දි රහිතව සේවයෙන් පහ කරනු ලැබීමටත් මා යටත්ව සිටින බවද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

6–879—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

නව ආකාර රබර් සැකසුම් අංශය

**1973 මැයි 25 වෙනි දින රජයේ ගැසට් පත්‍රයේ පළවූ ව්‍යාපාර ශ්‍රෙෂ්ඨ නිළධාරී තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවීමේ දැන්වීමට අමුතරවය.**

1\. පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව සඳහා උපාධියක් ඇති අයගෙන් ද ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

2\. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය 1973 ජූලි මස 09 වෙනි දින දක්වා දීර්ඝ කරන ලදී.

අධ්‍යක්ෂ,
නව ආකාර රබර් සැකසුම් අංශය.

1973 ජූලි මස 12 දා,
127, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 2.

6–830—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

රබර් පාලන දෙපාර්තමේන්තුව

රබර් පරීක්ෂක තනතුරු

රබර් පාලන දෙපාර්තමේන්තුවේ රබර් පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම් පත්‍ර 1973 ජූලි මස 10 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

1\. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරය. තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. 1972 ජනවාරි 01 වැනි දිනට ප්‍රථම පත් කරනු ලැබූ සහ 1972 ජනවාරි 01 වැනි දිනදී විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන්නාවූ නිලධාරීන්ට විශ්‍රාම වැටුප් සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් හිමිකම් ලැබීමට ඉඩ ඇත.

2\. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 3,864—144×18—රු. 6,456 ඒකාබද්ධ වැටුප.

3\. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවෙක් විසින්ම පහත සඳහන් සුදුසුකම් තමන්ට ඇති බවට සාධක ඉදිරිපත් කළ යුතු ය.

(i) තමා පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලාංකිකයකු බව ;

(ii) 1973 ජූලි මස 10 වැනි දින වන විට තමාගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර අවුරුදු 35 ට වැඩි නොවිය යුතු ය ;

(iii) පේරාදෙණියේ හෝ කුණ්ඩසාලේ ගොවිකම් පාසැලේ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වී තිබීම හෝ

(iv) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිත අඩු වශයෙන් අවුරුද්දක රබර් වගාව ඇතුළු වෙනත් භෝග වගාවන්ට අදාල ක්ෂේත්‍ර කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබීම ; හෝ

(v) අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා විභාගයෙන් සමත්වී තිබීම ; හෝ

(vi) උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ වෙනත් විද්‍යා විෂයයන් තුනකින් එකම විභාගයේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සාමාර්ථයක් සමග රබර් වගාව ඇතුළු වෙනත්

යෝග වගාවන්ට අදාල ක්ෂේත්‍ර කටයුතු පිළිබඳ තුන් අවුරුදු පළපුරුද්දක් තිබීම.

(රබර් පාලන දෙපාර්තමේන්තුවේ ලිපිකරු සේවයේ "අ" බණ්ඩයේ නිලධාරීන්ට සහ "ආ" බණ්ඩයේ අවුරුදු පහක සතුටුදායක සේවා කාලයක් සහ තම තනතුරුවල ස්ථිර කර ඇති නිලධාරීන් ද වයස හෝ/අධ්‍යාපනික සුදුසුකම් ගැන නොසලකා මෙම තනතුරුවලට අයදුම් කිරීමට සුදුස්සෝ වෙති.)

4 තම රාජකාරි ගමන් සඳහා වාහනයක් නඩත්තු කිරීම තෝරා පත් කර ගන්නා නිලධාරියාගෙන් අපේක්ෂා කෙරේ.

5. සෑම ඉල්ලුම් පත්‍රයක් සමගම උප්පැන්න සහතික පත්‍රයේත්, අධ්‍යාපනය පිළිබඳ ලබා ඇති උසස්ම සහතික පත්‍රයේත් ලඟදී ලබා ගන්නා ලද චරිත සහතික දෙකකත් පිටපත් එවිය යුතු යි.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

සී. චංමුගම්,
රබර් පාලක.

1973 ජූනි මස 15 වැනි දින,
රබර් පාලන දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය අංක 184,
කොළඹ 1.

### අයදුම් පතෙහි ආකෘතිය

### රබර් පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය (1973 ජූලි 10 දිනට වයස අවුරුදු) :————.
4. විවාහකද, අවිවාහකද යන වග :————.
5. අධ්‍යාපනික සුදුසුකම් :—
   (i) ගැසට් නිවේදනයේ 3 වන ඡේදය යටතේ අපේක්ෂා කරනු ලබන අධ්‍යාපනික සුදුසුකම් අතුරින් ඔබට ඇති සුදුසුකම් පිළිබඳ විස්තර (සහතිකවල පිටපත් අමුනන්න) :————.
   (ii) ඔබ ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර (සහතිකවල පිටපත් අමුනන්න) :————.
   (iii) වෙනත් විශේෂ සුදුසුකම් :————.
6. භාෂා දැනුම (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) :—

| | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|
| (ඒ) හොඳින් කථා කිරීමට දන්නා භාෂා : | ———— | ———— | ———— |
| (බී) මනා ලෙස කියවීමට දන්නා භාෂා : | ———— | ———— | ———— |
| (සී) හොඳින් ලිවීමට දන්නා භාෂා : | ———— | ———— | ———— |

7. පාසැලෙන් අස් වූ පසු නියුක්ත වූ සේවයන් සහ එක් එක් තනතුරු දරූ කාල සීමාවන් පිළිබඳ විස්තර වෙන් වෙන් වශයෙන් :————.
8. දැනට ඔබ රක්ෂාවක යෙදී සිටින්නෙහිද? (ඔව් හෝ නැත) :————.

ඔබ රක්ෂාවක යෙදී සිටීනම්, පහත සඳහන් විස්තර සපයන්න :—
   (ඒ) සේවය කරන ස්ථානයේ ස්වාමියාගේ නම සහ ලිපිනය :————.
   (බී) රක්ෂාවට පත් වූ දිනය :————.
   (සී) කරන වැඩ පිළිබඳ විස්තර සහ තනතුර :————.
   (ඩී) දැනට ලබන වැටුප (සියළුම දීමනා ඇතුළු) :————.

9. මෙම ඉල්ලුම් පත්‍රයට අදාල විශේෂ පළපුරුදුකම් හෝ සුදුසුකම් තිබේ නම්, ඒවා ලුහුඬින් සඳහන් කරන්න :—
10. අමුනා ඇති චරිත සහතික පිටපත් ලබාගත් අයගේ නම් සඳහන් කරන්න :————.
   (i) :————.
   (ii) :————.

ඉහත සඳහන් කරුණු සියල්ලම සෑම අතින්ම නිවැරදි බව මම සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6-858—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය

### පුරප්පාඩු

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල සේවයේ පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් භාරගනු ලැබේ. මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ෆෝර්මයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1973 ජූලි මස 6 දිනට හෝ ඊට පෙර, කොළඹ 7, 202, බෞද්ධාලෝක මාවතේ, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ, අතිරේක ලේඛකාධිකාරී, වෙත ලේඛිත තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ තමන් අයදුම් කරනු ලබන තනතුරු පැහැදිලිව සඳහන් කළයුතුය.

**සටහන.**—වෛකල්පිත විශ්‍රාම ගැනීමේ වයස් සීමාව ඉක්මවා නොසිටින ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයෙහි හෝ රාජ්‍ය සේවයෙහි නියුතු තැනැත්තන් කෙරෙහි මෙම තනතුරු සඳහා දක්වා ඇති උපරිම වයස් සීමාවන් බලපානු නොලැබේ.

**1. I ශ්‍රේණියේ ඉලෙක්ට්‍රොනික් කාර්මික**

**වැටුප් ක්‍රමය.**—මාසිකව සියළු දීමනා අතුළත්ව රු. 640—8×20—රු. 8.00.

**සුදුසුකම් :—**

(අ) දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 5 ක් ද සහිතව විෂයයන් 6 කින් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත්ව සිටිය යුතුය. මෙහිදී සම්මාන සාමාර්ථ ලත් විෂය යනට භෞතික විද්‍යාව සහ ගණිතයද ඇතුළත් විය යුතුයි.

(ආ) ඉලෙක්ට්‍රොනික් උපකරණ පරීක්ෂණය, අළුත්වැඩියා කිරීම සහ පිරිවැද්දුම පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්ද.

**වයස.**—අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**2. II ශ්‍රේණියේ ඉලෙක්ට්‍රොනික් කාර්මික**

**වැටුප් ක්‍රමය.**—මාසිකව සියළු දීමනා ඇතුළත්ව රු. 515—7×15—රු. 620.

**සුදුසුකම් :—**

(අ) දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමර්ථ 5 ක් සහිතව විෂයයන් 6 කින් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත්ව සිටිය යුතුය. මෙහිදී සම්මාන සාමාර්ථ ලත් විෂය යනට භෞතික විද්‍යාව සහ ගණිතයද ඇතුළත් විය යුතුයි.

(ආ) පිළිගත් ආයතනයක ඉලෙක්ට්‍රොනික් උපකරණ පරීක්ෂණය, අළුත්වැඩියා කිරීම සහ පිරිවැද්දුම පිළිබඳ යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්ද.

**වයස.**—අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

**3. කාර්මික සහකාර**

**වැටුප් ක්‍රමය.**—මාසිකව සියළු දීමනා ඇතුළත්ව රු. 350—18×15—රු. 620.

**සුදුසුකම් :—**

(අ) දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 2 ක් ද සහිතව විෂයයන් 6 කින් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත්ව සිටිය යුතුවීම සහ කෘෂිකර්ම විද්‍යාලයීය සහතිකය ලබා තිබීම ;

(ආ) ගොවිපලක වැඩ පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 2 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

**වයස.**—අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

**4. විනයාරක්ෂක නිලධාරි (මාෂල්)**

**වැටුප් ක්‍රමය.**—මාසිකව සියළු දීමනා ඇතුළත්ව රු. 350—18×15—රු. 620 (රු. 515 ට පෙර නියමිත විභාගයකින් යුත් කාර්යක්ෂමතා කඩඉමකි).

**සුදුසුකම් :—**

(අ) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 5 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6 කින් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත්ව සිටිය යුතුය ;

(ආ) ක්‍රීඩා වලට උද්යෝගිමත් ලෙස සහභාගිවිය යුතුව සිටිය යුතුය.

**වයස.**—අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

අතිරේක ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය.

1973 ජූනි මස 11 දින,
ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ දී ය.

### ආදර්ශ අයදුම්පත්‍රය

................................ තනතුර

1. (අ) මුලකුරු සමග නම :————.
   (ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
2. තැපැල් ලිපිනය :————.
3. ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :————.
4. (අ) උපන් දිනය :————.
   (ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :————.
5. අධ්‍යාපන සුදුසුකම් :————.
6. වෘත්තීය සුදුසුකම් :————.

7. සිංහල පිළිබඳව ලබා ඇති උසස්ම සුදුසුකම් :————.

8. ඉංග්‍රීසි පිළිබඳව ලබා ඇති උසස්ම සුදුසුකම් :————

9. පාසැලින් අස්වූ පසු නියුක්තවූ රැකියාවන් පිළිබඳ විස්තර (කරුණාකර එක් එක් ස්ථානයේ සේවයට බැඳුනු හා අස්වුනු දිනයන් සහ ලද වැටුප් සඳහන් කරන්න) :————.

10. දැනට දරණ තනතුර, ස්ථානය, වැටුප් ක්‍රමය සහ වැටුප :————.

11. අයදුම්කරු පිළිබඳව විමසිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.

12. වෙනත් කරුණු :————.

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සඳහන් කරන විස්තර සත්‍යවූද නිවැරදිවූද ඒවා බව සහතික කරමි. එමෙන්ම මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි හෝ ඒවා බව තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවද පත්වීම ලැබුවාට පසු මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි ඒවා බව සොයාගනු ලැබුවහොත්, කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකිරීමට ඉඩ ඇති බවද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–856—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

### ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

#### පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි තනතුරු

ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ ලියකියවිලි සහිතව, මෙම ආයතනයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රයෙහි සම්පූර්ණ විස්තර සඳහන් කර අධ්‍යක්ෂ, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, 33, එළිබැන්ක් පාර, කොළඹ 5 යන ලිපිනයට 1973 ජූලි මස 12 වන දිනට ප්‍රථම ලැබෙන පරිදි ලේඛනගත තැපෑලෙන් අයදුම්පත් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ වම් කෙළවරේ උඩ සඳහන් කළ යුතුය. තනතුරු කිහිපයක් සඳහා ඉල්ලුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**සුදුසුකම් :**

**(අ) පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි (අලෙවිය)**

ආර්ථික විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව, කෘෂිකර්ම අර්ථ ශාස්ත්‍රය, වාණිජ විද්‍යාව හෝ ව්‍යාපාර පරිපාලනය යන විෂයය අතුරෙන් එකකින් I පන්තියේ හෝ II පන්තියේ (උසස් පෙළ) උපාධිධාරියකු විය යුතුය.

නැතහොත්

පිළිගත් විශ්ව විද්‍යාලයක ඉහත සඳහන් විෂයය එකක් හෝ වැඩි ගණනක් පිළිබඳ උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයෙහි පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධියක් දැරිය යුතුය.

කෘෂිකර්ම භාණ්ඩ අලෙවිය පිළිබඳ පළපුරුද්ද ඇත්නම් එය අමතර සුදුසුකමක් වේ.

**(ආ) පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි (සමාජ විද්‍යාව)**

සමාජ විද්‍යාව සහ/හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයක I පන්තියේ හෝ II පන්තියේ (උසස් පෙළ) උපාධිධාරියකු විය යුතුය.

නැතහොත්

සමාජ විද්‍යාව විෂයය සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හා අදාළ ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධියක් දැරිය යුතුය. සමාජ—ආර්ථික හැදෑරීම් පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

**(ඇ) පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි (සමුපකාර හා ණය)**

ආර්ථික විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව, කෘෂිකර්ම අර්ථ ශාස්ත්‍රය. වාණිජ විද්‍යාව හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ I පන්තියේ හෝ II පන්තියේ (උසස් පෙළ) උපාධිධාරියකු විය යුතුය.

නැතහොත්

ඉහත සඳහන් විෂයය එකක් හෝ වැඩි ගණනක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයෙහි පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධියක් දැරිය යුතුය.

සමුපකාර ව්‍යාපාරය හා ග්‍රාමීය ණය ක්‍රමය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

**(ඈ) පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි (ඉඩම් ජනාවාස කරවීම)**

කෘෂිකර්ම, අර්ථ ශාස්ත්‍රය, ආර්ථික විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව, ග්‍රාමීය සමාජ විද්‍යාව හෝ භූගෝල විද්‍යාව පිළිබඳ I පන්තියේ හෝ II පන්තියේ (උසස් පෙළ) උපාධිධාරියකු විය යුතුය.

නැතහොත්

ඉහත සඳහන් විෂයය එකක් හෝ වැඩි ගණනක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහ අදාළ විෂයය ක්ෂේත්‍රයෙහි පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධියක් දැරිය යුතුය.

ජනපද හා ඉඩම් ජනාවාස කරවීමේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

**(ඉ) පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි (කෘෂිකර්ම අර්ථ ශාස්ත්‍රය)**

අර්ථ ශාස්ත්‍රය, කෘෂිකර්ම අර්ථ ශාස්ත්‍රය හෝ කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ I පන්තියේ හෝ II පන්තියේ (උසස් පෙළ) උපාධිධාරියකු විය යුතුය.

නැතහොත්

කෘෂිකර්ම අර්ථ ශාස්ත්‍රය විෂයයක් වශයෙන් ගෙන පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධියක් හා අදාළ විෂයය පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධියක් දැරිය යුතුය.

කෘෂිකර්ම අර්ථ ශාස්ත්‍රය පිළිබඳ පළපුරුද්ද හා කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ක්‍රම සම්පාදනය කිරීමේ පළපුරුද්ද අමතර සුදුසුකම් වේ.

(ii) විධායක පළපුරුද්ද හා ක්ෂේත්‍ර පළපුරුද්ද සෑම තනතුරක්ම සඳහා අමතර සුදුසුකමක් වේ.

අයදුම්කරුවන් විසින් අදාළ ක්ෂේත්‍ර පිළිබඳව තමන්ගේ සුදුසුකම් දක්වීමට කැමැත්තේ නම්, තම ප්‍රකාශනවල පිටපත් හෝ ටයිප් කරන ලද අත් පිටපත් ඉදිරිපත් කළ යුතුය. ඒවා පරීක්ෂා කිරීමෙන් පසුව ආපසු එවනු ඇත.

(iii) රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා ආයතනවල නිලධාරීන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලන්නේ ඔවුන් යටත් පිරිසෙයින් අදාළ විෂයයෙහි වර්ෂ 8 ක පළපුරුද්දක් ඇති උපාධිධාරීන් නම් පමණකි.

(iv) වයස.—ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට අඩු විය යුතුය. මෙය රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා ආයතනවල සේවකයින්ට බල පාන්නේ නැත.

2. වැටුප්.—(i) පහත සඳහන් වැටුප් ක්‍රම ඇති ශ්‍රේණි 3 ක් වනු ඇත.

(i) ශ්‍රේණිය—රු. 1,500—6 × 75 රු. 1,950.

(ii) ශ්‍රේණිය—රු. 1,200—5 × 60—රු. 1,500.

(iii) ශ්‍රේණිය—රු. 700—5 × 40—5 × 50—රු. 1,150, (රු. 900 ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉමකි)

(ii) ඉල්ලුම්කරුවන් බඳවා ගනු ලබන්නේ 3 වෙනි ශ්‍රේණියටයි. විශේෂ අවස්ථාවල අයදුම්කරුවන්ගේ විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් වැටුප් පරිමාණයන්ගෙන් එකක සුදුසු ස්ථානයක තැබීම ගැන සලකා බලනු ලැබේ.

(iii) III ශ්‍රේණියේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් සමත් වීමට ප්‍රථම පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පාලක මණ්ඩලය සෑහීමට පත් වෙන අයුරින් ක්‍රියා කළ යුතුය :—

(අ) මෙම ආයතනයට වටිනාකමක් ඇති, හා අදාළ වූ පර්යේෂණ ප්‍රකාශනයට පත් කිරීම.

(ආ) පුහුණු කිරීම සම්බන්ධයෙන් වැඩ කොටසක් ඉටු වීම.

(ඇ) අන්තර් ජාතික කාර්ය මණ්ඩලයක් සමඟ ක්‍රියා කිරීමේ දක්ෂතාවය.

(iv) III වෙනි ශ්‍රේණියේ නිලධාරියෙක් පහත සඳහන් කරුණු අතරින් එකක් සම්පූර්ණ කිරීමෙන් II වෙනි ශ්‍රේණියට සමත් වීමට සුදුසුකම් ලබයි.

(i) අදාළ විෂයයෙහි පශ්චාත් උපාධියක් ලබා ගැනීම. (පශ්චාත් උපාධියක් ඇතිව ආයතනයට බැඳෙන අයදුම්කරුවන් අදාළ විෂයයෙහි කළ පර්යේෂණ ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය).

(ii) පර්යේෂණ ප්‍රකාශන (කාර්යක්ෂම කඩඉම සමත්වීම සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රකාශන මේ සඳහා සලකා බලනු නොලැබේ).

(iii) පුහුණු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් කරන ලද වැඩ කොටස.

II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට ස්වයංක්‍රිය උසස්වීමක් නැත.

(V) (II) ශ්‍රේණියේ සිට I ශ්‍රේණිය දක්වා උසස් වීමට සුදුසු වනුයේ, නිලධාරියාගේ වැඩ හා හැසිරීම I ශ්‍රේණියට උසස් කිරීමට තරම් සුදුසු වන්නේ යයි පාලක මණ්ඩලය සෑහීමට පත් වුවහොත් පමණි.

3. **සේවා කොන්දේසි.—තෝරාගත් අයදුම්කරුවන්,**

(අ) වර්ෂ 2 ක ආධුනික තත්ත්වයේ සිටිනු ඇත. රජයේ දෙපාර්තමේන්තු සංස්ථා හා ආයතනවල ස්ථිර නිලධාරීන් වර්ගයක් තුළ වැඩ බලනු ඇත.

(ආ) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ රෙගුලාසිවලට හා දැනට පනවා ඇති හෝ අනාගතයේදී රජය විසින් පැනවීමට හැකි රාජ්‍ය භාෂා රෙගුලාසිවලට යටත් විය යුතුය.

(ඇ) විදේශීය විශේෂඥයන්ගේ අනුරූප නිලධාරීන් වශයෙන් ක්‍රියා කළයුතු අතර අන්තර් ජාතිය කණ්ඩායමක සාමාජිකයකු වශයෙන් ක්‍රියා කිරීමේ හැකියාවක් තිබිය යුතුය.

(ඈ) දිවයිනේ ඕනෑම පළාතක ක්ෂේත්‍ර වැඩ කිරීමට සූදානම් විය යුතුය.

(ඉ) සේවක අර්ථසාධක අරමුදලට මුදල් ගෙවිය යුතු අතර 1972 අංක 5 දරණ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ පනත යටතේ දැනට පනවා ඇති හා අනාගතයේ පැන විය හැකි රෙගුලාසිවලට යටත් විය යුතුය.

4. **සාමාන්‍ය කොන්දේසි.**—(1) පහත සඳහන් ලියකියවිලිවල පිට පත් ඉල්ලුම්පත්‍රයට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) පිළිගත් පුද්ගලයන් දෙදෙනෙකුගෙන් ලබා ගත් චරිත සහතික දෙකක් ; ඉන් එකක් අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ (ආචාර්ය) මහාචාර්ය තැනගෙන් විය යුතුය.

(ඇ) ලබාගත් ඉහළම අධ්‍යාපන සහතික.

(ඈ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි විෂයයවලින් සමත් වූ ඉහළම විභාගය පිළිබඳ සහතිකය.

2. ඉල්ලුම්පත් ලැබුණු බවට දැනුම්දීමක් නොකරනු ඇත. මෙම දැන්වීමේ අවශ්‍යතාවලට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. අවශ්‍ය වූ විට ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

3. කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් කැඳවනු ඇත. ගමන් වියදම් හෝ වෙනත් වියදම් නොගෙවනු ඇත.

4. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයක් හා සෞඛ්‍ය තත්ත්වයක් ඇති බව ඔප්පු කළ යුතුය.

5. දැනට රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් හැර සෙසු තෝරාගත් අපේක්ෂකයන් රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් කරනු ලබන දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු බව පරීක්ෂා කිරීම සඳහා සෞඛ්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

6. රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා ආයතනවල සේවය කරන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ගැන සලකා බලනු ලබන්නේ, මෙම තනතුරට තෝරා ගතහොත් මුදා හැරීමට සූදානම් බවට නිර්දේශයක් සහිතව දෙපාර්තමේන්තු,/සංස්ථා ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළහොත් පමණි.

අධ්‍යක්ෂ,
ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

33, එළිබැන්ක් පාර,
කොළඹ 5.

6–878—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කටුබැද්ද මංඩපයට හා අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට තාක්ෂණ විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම**

1974 අධ්‍යයන වර්ෂය සඳහා තුන් අවුරුදු (දෑවුරුදු මණ්ඩප/ආයතනික හා එක් අවුරුදු කර්මාන්ත පුහුණුවීම්) පූර්ණ කාල තාක්ෂණ විද්‍යා ජාතික ඩිප්ලෝමා දිවා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කටුබැද්ද මණ්ඩපයට හා අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් භාරගනු ලැබේ.

2. **සුදුසුකම් :**

(අ) **වයස**—1974 ජනවාරි මස 1 වැනි දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 16 ට අඩු නොවිය යුතුය. වයස අවුරුදු 20 ට අඩු අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ආ) **අධ්‍යාපන සුදුසුකම්.**—අ.පො.ස. (සා.පෙ) විභාගයේ දී ශුද්ධ ගණිතය, භෞතික විද්‍යාව හා භාෂාවක් ඇතුළුව විෂයයන් හයකින් එක්වර සාමාර්ථය ලබා තිබිය යුතු අතර, එම වනාවේදීම යටත් පිරිසෙයින් විෂයයන් තුනකට සම්මාන සාමාර්ථ තිබිය යුතුවාත් හැර, ඉන් දෙකක් පහත දැක්වෙන විෂයය මාලාවෙන් විය යුතුය :—

(1) ශුද්ධ ගණිතය
(2) ව්‍යවහාරික ගණිතය
(3) භෞතික විද්‍යාව
(4) රසායන විද්‍යාව
(5) යාන්ත්‍රික හා ජ්‍යාමිතික ඇඳීම
(6) උසස් ගණිතය

3. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කටුබැද්ද මණ්ඩපයට ඇතුළත් වීමට ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම හැකි අතර හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට පුරුෂ පක්ෂය පමනක් ඇතුළත් කර ගනු ලැබේ.

4. මෙහි පහත දැක්වෙන ආදර්ශ අයදුම් පත අනුව අයදුම් කළ යුතුය. (මුද්‍රිත ෆෝරම නිකුත් කරනු නොලැබේ.)

5. පහත දැක්වෙන අයුරින් අයදුම් පත් එවිය යුතුය:—

පාසල් අයදුම්කරුවෝ—පාසැලක සිසුවකු වශයෙන් 2 (ආ) ඡේදයේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් ලැබූ අයදුම්කරුවකු විසින් සිය අයදුම් පත, එම පාසල පිහිටා තිබෙන ප්‍රදේශයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ තැනට ඉදිරිපත් කළ යුතුය.

බහිර අයදුම්කරුවෝ—බාහිර සිසුවකු වශයෙන් 2 (ආ) ඡේදයේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් ලැබූ අයදුම්කරුවකු විසින් සිය අයදුම් පත, තමා පළමුවරට අ. පො. ස. (සා. පෙ.) විභාගයට පෙනී සිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ තැනට ඉදිරිපත් කළ යුතුය.

6. 1973 ජූලි මස 25 වැනි දින නොඉක්මවා ලැබෙන සේ අයදුම් පත්, නියමිත ප්‍රදේශයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ තැනට ඉදිරිපත් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම් පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

7. ඇතුළත් කර ගැනීම සඳහා සිසුන් තෝරා ගනු ලබන්නේ දිස්ත්‍රික්ක කොටස් ක්‍රමය 2 (ආ) ඡේදයේ සඳහන් විෂයය මාලාවෙන් ලබාගත් සාමාර්ථය පදනම් කරගෙනය.

පී. උඩගම,
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

අධ්‍යාපන අමාත්‍යාංශය,
මැලේ වීදිය, කොළඹ 2,
1973.6.11.

ඉල්ලුම් පත්‍රය

**ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කටුබැද්ද මංඩපයේ හා අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ තාක්ෂණ විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාවට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය**

**සැලකිය යුතුයි.**—ඉහත දැක්වෙන දැන්වීමේ පරිදි **වයස හා** අධ්‍යාපන සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කළ යුතුය:—

(1) සම්පූර්ණ නම:————.
(පැහැදිලි අකුරෙන්)

(2) ලිපිනය:————.

(3) උපන් දිනය:————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමණිය යුතුය. මුල් පිටපත නොවේ.)

(4) වයස—1974.1.1 දිනට අවුරුදු ——, මාස ——, දින——.

(5) ජතිය:————.

(6) ස්ත්‍රී පුරුෂ භාවය:————.

(7) (අ) ඉහත දැක්වෙන දැන්වීමේ 2 (ආ) ඡේදයේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් ලබාගත් අ. පො. ස. (සා. පෙ.) විභාගයේ වර්ෂය, මාසය හා විභාග අංකය:————.

අවුරුද්ද:————.

මාසය:————.

විභාග අංකය:————,

(ආ) සමත් වූ විෂයයන්, ලබාගත් තත්ත්වය සමග (සාමාන්‍ය සාමාර්ථය, සම්මාන සාමාර්ථය, විශිෂ්ඨ සාමාර්ථය ආදී වශයෙන්):————.

| විෂයයන් | ලබාගත් තත්ත්වය |
|---|---|
| 1. ශුද්ධ ගණිතය | ———— |
| 2. භෞතික විද්‍යාව | ———— |
| 3. භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | ———— |
| 4. ———— | ———— |
| 5. ———— | ———— |
| 6. ———— | ———— |
| 7. ———— | ———— |
| 8. ———— | ———— |

(8) (අ) පාසැල් අයදුම්කරු:————.

ඉහත දැක්වෙන දැන්වීමේ 2 (ආ) ඡේදයේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් ලබාගත් මහා විද්‍යාලයයේ හෝ අනුමත කළ පෞද්ගලික පාසැලේ නම සහ ලිපිනය:————.

(ආ) බාහිර අයදුම්කරු:————.

පලමුවරට අ. පො. ස. (සා. පෙ.) විභාගයට පෙනී සිටි මහා විද්‍යාලයයේ හෝ අනුමත කළ පෞද්ගලික පාසැලේ නාම හා ලිපිනය:————.

(9) පියාගේ/මවගේ හෝ භාරකරුගේ නම හා ලිපිනය:————.

(10) ඇතුල්වීමේ කැමැත්ත:————.

ඇතුල්වීමේ බලාපොරොත්තු වනුයේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කටුබැද්ද මණ්ඩපයට ද, හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට ද යන්න වැඩි කැමැත්ත අනුව සඳහන් කරන්න.

1.

2.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————.

6–731—73.06 22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. **සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ජූලි | 73.07.06 | සිකුරාද | ... | 73.06.27 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... | 73.07.04 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... | 73.07.11 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... | 73.07.18 | බදාදා | දවල් | 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.25 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.01 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.08 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.15 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.22 | බදාදා | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.29 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.05 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.11 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.19 | බදාදා | දවල් | 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 ඔක්තෝබර් 20 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.